---

දමන ප්‍රාදේශිය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 නොවැම්බර් 17 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 18 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 මැයි 13 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව දමන ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.133,000 ක මුදල ආදායමක් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. තවද 2011 දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ආදායම රු.412,600 ක් වුවද, රු.1,090,075 ක් ලෙස ගිණුම්ගතකර තිබුණෙන් හිඟ මුද්දර ගාස්තු මුදල රු. 677,475 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවිම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 12,465,819 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 169,302 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 2,132,450 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 735,000 | 666,856 | 1,385,801 |
| කුලී | 1,525,000 | 1,235,972 | 189,555 |
| බලපත්‍ර ගාස්තු | 1,025,000 | 905,254 | 6,744 |
| වෙනත් ආදායම් | 160,000 | 492,968 | 1,415 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 302,400 |
| මුද්දර ගාස්තු | 1,090,075 |

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් මාසය වන විට පළාත් පාලන සේවයේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපට ගෙවිය යුතු රු. 103,283 ක් ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) දේශිය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් රු. 1,950,000 ක ණය මුදල ගිවිසුම් ප්‍රකාරව ගෙවිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ දැනට භාවිතා කරන වාහන 06 ක් සභාවේ නමට පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සංවර්ධන අරමුදලින් රු. 485,185 ක වියදමක් සංවර්ධන කටයුතු වලට නොයොදවා පොදු වියදම් සඳහා යොදවා තිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය